සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| 06 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | 62 S |
|---|---|---|
| නම: ............................................ | **පුරවැසි අධ්‍යාපනය** | **කාලය පැය දෙකයි** |

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

## I කොටස

- **ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැන් පුරවන්න.**
  (ආකල්ප / විදුහල්පතිතුමා / අනධ්‍යයන / ලොග් සටහන්/ කළමනාකරණ)

01) පාසලේ ඉතිහාසය ඉගෙන ගැනීම සඳහා ........................................................................පොත භාවිතා කළ හැකිය.

02) පාසලේ පාලනයට සම්බන්ධ ප්‍රධානියා ............................................................................................ වේ.

03) පාසල් සිසුන් දැනුම, කුසලතා හා ................................................................... වලින් සංවර්ධනය කිරීම ගුරුවරුන්ගේ වගකීමක් වේ.

04) පාසල් භූමියේ පවිත්‍රතාවය හා අලංකාරය පවත්වාගෙන යාමට සහයවීම ........................................................ කාර්යමණ්ඩලයේ වගකීමකි.

05) පාසල් සංවිධාන ව්‍යුහය තුළ පවත්නා පාසල් ........................................... කමිටුව පාසලේ පරිපාලන කටයුතු වලට බෙහෙවින් උපකාරී වේ.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06) පුද්ගලයා තුළ පවතින දක්ෂතාවලින් උපරිම ඵල නෙලාගත හැකි වනුයේ ජීවිත ස්වභාවය තේරුම් ගෙන ඒවා තම දක්ෂතා හා සම්බන්ධ කරගැනීමෙනි. (.....................)

07) අලසකමින් අවේගශීලී බවින් යුතුව කටයුතු කිරීමෙන් පුද්ගලයකු තුළ පවත්නා දුර්වලතා අවම කරගත හැකිය. (.....................)

08) විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයින්ගේ අත්දැකීම් හා දැනුම ලබාගැනීමෙන් පුද්ගලයෙකු සතු හැකියා හා දක්ෂතා වැඩිදියුණු කර ගත හැකිය. (.....................)

09) පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ තුළ යහපත් අරමුණු ඇතිකරගැනීම ඔබේත් සමාජයේත් විනාශයට හේතුවේ. (.....................)

10) ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතුවල නිරත වන ශිෂ්‍යයෙකුට තම සහජ කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව උදාවේ. (.....................)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11) 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන රුවිරට ඔහුගේ සම්පූර්ණ නම නිවැරදිව දැනගැනීම සඳහා අනුගමනය කළ යුතු වඩාත් නිවැරදි ක්‍රියාමාර්ගය මින් කුමක්ද?
   1. පංතිභාර ගුරුතුමියගෙන් විමසීම.
   2. පංති නාමලේඛණය පරීක්ෂා කර බැලීම.
   3. උප්පැන්න සහතිකය පරීක්ෂා කර බැලීම.
   4. ඥාතියෙකුගෙන් විමසීම.

12) සැලසුම් සහගත ශිෂ්‍යයෙකු තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
   1. තම අරමුණු ඉටුකරගැනීම.
   2. වැඩකල් දැමීම.
   3. පසුතැවීමෙන් කටයුතු කිරීම.
   4. මානසික ආතතිය ඇතිවීම.

13) පාසල් ගීය ගායනා කිරීමේදී ප්‍රදර්ශනය කළ යුතු නිවැරදි ඉරියව් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මින් වඩාත් නිවැරදි ඉරියව්ව වන්නේ,
   1. පහසුවෙන් සිටිමින් ගායනා කිරීම.
   2. ජංගම දුරකථනය භාවිතා කිරීම.
   3. පාසල් ගීතයට අගෞරව වන ලෙස ගායනා කිරීම.
   4. සීරුවෙන් සිටිමින් තාලානුරූපව ගායනා කිරීම.



LIVEWORKSHEETS

14) ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩා ම පරිපාලන ඒකකය වන්නේ මින් කුමක්ද?
1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
2. ග්‍රාම නිලධාරී කොට්ඨාශය
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය
4. පළාත්සභා බල ප්‍රදේශය

15) හිරුඑළිය, වාතය හා ජලය යන භෞතික සම්පත්වලින් ලබාගන්නා ප්‍රයෝජනයක් වන්නේ,
1. ප්‍රවාහනය සඳහා භාවිතා කිරීම.
2. කෘෂි කර්මාන්තය සඳහා භාවිතා කිරීම.
3. බලශක්තිය නිපදවීම සඳහා භාවිතා කිරීම.
4. පානීය ජල අවශ්‍යතා සඳහා භාවිතා කිරීම.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**



16) A පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම්කරන්න.

..............................................................

17) ඔහු හැඳින්වෙන අන්වර්ථ නාමය ලියන්න. ..............................................................

18)



රූපයේ දැක්වෙන අවස්ථාවකට ඔබ සම්බන්ධ වූ විට ඔබ තුළ වර්ධනය වන ගුණාංග දෙකක් ලියන්න.

..............................................................

..............................................................

19) එවැනි අවස්ථාවකදී ඇතිවිය හැකි අනතුරු දෙකක් ලියන්න.

..............................................................

..............................................................

20) පින්තූරයෙන් දැක්වෙන අවස්ථාව හැර පාසල් ශිෂ්‍යයෙකු තුළ පවත්නා දක්ෂතා සංවර්ධනය කර ගැනීම සඳහා පාසලෙන් ලැබෙන වෙනත් අවස්ථා දෙකක් ලියන්න.

..............................................................

.............................................................. (ල.20×2 = 40)



LIVEWORKSHEETS